සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ඉතිහාසය I (I කොටස)
வரலாறு I (பகுதி I)
History I (Part I)

**25 S I**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

විභාග අංකය: ..................................

**උපදෙස්:**

* මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
* **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
* කොටස් දෙකට ම මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, **I** කොටස, **II** කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක **1** සිට **05** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ. එම නො ගැළපෙන** නම කුමක්දැයි හඳුනාගෙන එහි **අංකය වරහන් තුළ ලියන්න.**

**1.** (1) දීපවංස (2) මහාවංස (3) හරිවංස
(4) ථූපවංස (5) බෝධිවංස (.........)

**2.** (1) පරාක්‍රම සමුද්‍රය (2) කවුඩුලු වැව (3) ගිරිතලේ වැව
(4) කන්තලේ වැව (5) මින්නේරි වැව (.........)

**3.** (1) ඉට්ඨිය (2) උත්තිය (3) සම්භල
(4) භද්දසාල (5) මහානාම (.........)

**4.** (1) දන්තුරේ සටන (2) වෙල්ලස්ස සටන (3) බලන සටන
(4) රන්දෙනිවෙල සටන (5) ගන්නෝරුව සටන (.........)

**5.** (1) රොබට් බ්‍රවුන්රිග් (2) එඩ්වඩ් බාන්ස් (3) චාල්ස් කැමරන්
(4) ජෝර්ජ් ඇන්ඩර්සන් (5) ඇන්ඩෲ කැල්ඩිකොට් (.........)

- අංක **06** සිට **10** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නො ගැළපේ. එම නො ගැළපෙන** යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ **අංකය,** ඉදිරියේ ඇති **වරහන් තුළ ලියන්න.**

**6.** (1) සිරි සංඝබෝධි - සද්ධාතිස්ස
(2) ගජබාහුක-ගාමණී - පළමුවන ගජබාහු
(3) මේඝවණ්ණ අභය - ගෝඨාභය
(4) ලැමැණි බෝනා මුගලන් - තුන්වන මොග්ගල්ලාන
(5) කාලිංග විජයබාහු - මාඝ (.........)

**7.** (1) උඩරට රාජධානියේ ප්‍රථම පාලකයා - සේනාසම්මත වික්‍රමබාහු
(2) ප්‍රථම පෘතුගීසි කපිතාන් ජෙනරාල් - පේද්‍රො ලොපේස් ද සූසා
(3) ප්‍රථම ලන්දේසි ආණ්ඩුකාරවරයා - විලෙම් ජේ. කෝස්ටර්
(4) ප්‍රථම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා - ෆ්‍රෙඩ්රික් නෝර්ත්
(5) ප්‍රථම විධායක ජනාධිපතිවරයා - විලියම් ගොපල්ලව (.........)

**8.** (1) 1797-98 කැරැල්ල - තෝමස් මේට්ලන්ඩ්
(2) 1817-18 නැඟී සිටීම - රොබට් බ්‍රවුන්රිග්
(3) 1848 නැඟී සිටීම - ටොරිංටන්
(4) 1883 කොටහේන කෝලාහලය - ජේම්ස් ලොංඩන්
(5) 1915 සිංහල-මුස්ලිම් කෝලාහලය - රොබට් චාමර්ස් (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

9. (1) කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ - ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම
(2) කෲ-මැකලම් ප්‍රතිසංස්කරණ - විධායක සභාවට නිලනොලත් සාමාජිකයකු පත් කිරීම
(3) මැනිං ප්‍රතිසංස්කරණ - පළාත්බද නියෝජන ක්‍රමය හඳුන්වාදීම
(4) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ - සර්වජන ඡන්දබලය හඳුන්වාදීම
(5) සෝල්බරි ප්‍රතිසංස්කරණ - කැබිනට් ක්‍රමය හඳුන්වාදීම (.........)

10. (1) ආරුමුග නාවලර්තුමා - වණ්ණපොන්නෙයි සයිව ප්‍රගාස විද්‍යාශාලෙයි
(2) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි - පරම ධම්ම චේතිය පිරිවෙන
(3) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි - විද්‍යෝදය පිරිවෙන
(4) රත්මලානේ ධම්මාලෝක හිමි - විද්‍යාලංකාර පිරිවෙන
(5) සිද්දි ලෙබ්බේතුමා - සහිරා විද්‍යාලය (.........)

- අංක **11** සිට **15** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නො වේ. Y තීරුව, X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග **පහෙන්** එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන් තුළ ලියන්න.**

11.

| X | Y |
|---|---|
| (i) දේවානම්පියතිස්ස රජතුමා | A සෝමාවතිය |
| (ii) කාවන්තිස්ස රජතුමා | B මිරිසවැටිය |
| (iii) ගිරි අභය රජතුමා | C අභයගිරිය |
| (iv) දුටුගැමුණු රජතුමා | D තිස්සමහාරාමය |
| (v) වළගම්බා රජතුමා | E හත්ථාළ්හක මෙහෙණවර |

(1) EDCBA (2) ACBED (3) CBADE (4) EDABC (5) BADCE (.........)

12.

| X | Y |
|---|---|
| (i) පළමුවන පරාක්‍රමබාහු රජතුමා | A කුරුණෑගල |
| (ii) දෙවන පරාක්‍රමබාහු රජතුමා | B ගම්පොළ |
| (iii) හතරවන පරාක්‍රමබාහු රජතුමා | C කෝට්ටේ |
| (iv) පස්වන පරාක්‍රමබාහු රජතුමා | D පොළොන්නරුව |
| (v) හයවන පරාක්‍රමබාහු රජතුමා | E දඹදෙණිය |

(1) EABCD (2) CBDEA (3) DEABC (4) ECABD (5) DBAEC (.........)

13.

| X | Y |
|---|---|
| (i) විජයබා පිරිවෙන | A කැරගල |
| (ii) පද්මාවතී පිරිවෙන | B රයිගම |
| (iii) ශ්‍රී ඝනානන්ද පිරිවෙන | C පැපිලියාන |
| (iv) සුනේත්‍රා දේවී පිරිවෙන | D තොටගමුව |
| (v) ඉරුගල්කුලතිලක පිරිවෙන | E දෙවිනුවර |

(1) CDABE (2) ECABD (3) CDBEA (4) DABCE (5) DBAEC (.........)

14.

| X | Y |
|---|---|
| (i) කොට්ටල් බද්ද | A අලි ඇතුන් පිළිබඳ කාර්යාංශය |
| (ii) කින්නර බද්ද | B කුඹල් කාර්යාංශය |
| (iii) කුරුවේ බද්ද | C ශිල්පීන් පිළිබඳ කාර්යාංශය |
| (iv) මඩිගේ බද්ද | D විවීමේ කාර්යාංශය |
| (v) බඩහැල බද්ද | E ප්‍රවාහන කාර්යාංශය |

(1) BDEAC (2) CDAEB (3) CBDEA (4) AEDBC (5) DEBAC (.........)

15.

| X | Y |
|---|---|
| (i) මහාමාර්ග ආඥා පනත | A 1856 |
| (ii) විහාරගම් ආඥා පනත | B 1897 |
| (iii) මහනගරසභා ආඥා පනත | C 1848 |
| (iv) ගම්සභා ආඥා පනත | D 1865 |
| (v) මුඩුබිම් පනත | E 1871 |

(1) CADEB (2) BEDCA (3) CBAED (4) DCBAE (5) ACBED (.........)

[ තුන්වෙනි පිටුව බලන්න.

- අංක **16** සිට **20** තෙක් සෑම ප්‍රශ්නයකට ම ගැළපෙන පිළිතුර තෝරා ඊට අදළ අංකය ඉදිරියේ ඇති **වරහන් තුළ ලියන්න**.

**16.** **පහත සඳහන් දාගැබ් ඉදි කරන ලද කාලය අනුව ඒවායේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ කවර වරණයේ ද?**

(1) මිරිසවැටිය, ථූපාරාමය, අභයගිරිය, ජේතවනාරාමය, රන්කොත් වෙහෙර
(2) ථූපාරාමය, මිරිසවැටිය, අභයගිරිය, ජේතවනාරාමය, රන්කොත් වෙහෙර
(3) ථූපාරාමය, අභයගිරිය, මිරිසවැටිය, රන්කොත් වෙහෙර, ජේතවනාරාමය
(4) ජේතවනාරාමය, රන්කොත් වෙහෙර, ථූපාරාමය, අභයගිරිය, මිරිසවැටිය
(5) අභයගිරිය, ථූපාරාමය, ජේතවනාරාමය, මිරිසවැටිය, රන්කොත් වෙහෙර (………)

**17.** **අනුරාධපුර සමයේ මුල් භාගයේ මෙරට පාලනය කළ රජවරුන්ගේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත දැක්වෙන කවර වරණයේ ද?**

(1) සද්ධාතිස්ස, ලඤ්ජතිස්ස, ථූලත්ථන, බල්ලාටනාග, වළගම්බා
(2) වළගම්බා, සද්ධාතිස්ස, ථූලත්ථන, බල්ලාටනාග, ලඤ්ජතිස්ස
(3) සද්ධාතිස්ස, ථූලත්ථන, ලඤ්ජතිස්ස, බල්ලාටනාග, වළගම්බා
(4) ලඤ්ජතිස්ස, ථූලත්ථන, සද්ධාතිස්ස, බල්ලාටනාග, වළගම්බා
(5) වළගම්බා, සද්ධාතිස්ස, ථූලත්ථන, ලඤ්ජතිස්ස, බල්ලාටනාග (………)

**18.** **රාජ්‍ය පාලන මධ්‍යස්ථාන විතැන්වීමේ දී ඒවායේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත සඳහන් කවර වරණයේ ද?**

(1) දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ
(2) දඹදෙණිය, යාපහුව, ගම්පොළ, කුරුණෑගල, කෝට්ටේ
(3) යාපහුව, කෝට්ටේ, දඹදෙණිය, ගම්පොළ, කුරුණෑගල
(4) කුරුණෑගල, යාපහුව, දඹදෙණිය, කෝට්ටේ, ගම්පොළ
(5) ගම්පොළ, දඹදෙණිය, කුරුණෑගල, යාපහුව, කෝට්ටේ (………)

**19.** **දහනවවන සියවසේ දෙවන භාගය තුළ ශ්‍රී ලංකාව පාලනය කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන්ගේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත සඳහන් කවර වරණයේ ද?**

(1) හෙන්රි වෝඩ්, විලියම් ග්‍රෙගරි, ආතර් ගෝර්ඩන්, හර්කියුලීස් රොබින්සන්, වෙස්ට් රිජ්වේ
(2) හෙන්රි වෝඩ්, ආතර් ගෝර්ඩන්, විලියම් ග්‍රෙගරි, හර්කියුලීස් රොබින්සන්, වෙස්ට් රිජ්වේ
(3) හෙන්රි වෝඩ්, විලියම් ග්‍රෙගරි, හර්කියුලීස් රොබින්සන්, වෙස්ට් රිජ්වේ, ආතර් ගෝර්ඩන්
(4) විලියම් ග්‍රෙගරි, හෙන්රි වෝඩ්, ආතර් ගෝර්ඩන්, හර්කියුලීස් රොබින්සන්, වෙස්ට් රිජ්වේ
(5) හෙන්රි වෝඩ්, හර්කියුලීස් රොබින්සන්, විලියම් ග්‍රෙගරි, ආතර් ගෝර්ඩන්, වෙස්ට් රිජ්වේ (………)

**20.** **නිදහසින් පසු ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යවරුන්ගේ නිවැරදි අනුපිළිවෙළ අඩංගු වන්නේ පහත සඳහන් කවර ලැයිස්තුවේ ද?**

(1) බදියුද්දීන් මහමුද්, ඊ.ඒ. නුගවෙල, ඩබ්ලිව්. දහනායක, එම්.ඩී. බණ්ඩා, බී.එච්. අලුවිහාරේ
(2) බී.එච්. අලුවිහාරේ, ඊ.ඒ. නුගවෙල, එම්.ඩී. බණ්ඩා, ඩබ්ලිව්. දහනායක, බදියුද්දීන් මහමුද්
(3) ඊ.ඒ. නුගවෙල, ඩබ්ලිව්. දහනායක, එම්.ඩී. බණ්ඩා, බදියුද්දීන් මහමුද්, බී.එච්. අලුවිහාරේ
(4) ඊ.ඒ. නුගවෙල, එම්.ඩී. බණ්ඩා, ඩබ්ලිව්. දහනායක, බී.එච්. අලුවිහාරේ, බදියුද්දීන් මහමුද්
(5) ඩබ්ලිව්. දහනායක, ඊ.ඒ. නුගවෙල, එම්.ඩී. බණ්ඩා, බදියුද්දීන් මහමුද්, බී.එච්. අලුවිහාරේ (………)

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක්** අදාළ මාතෘකාවට **නො** ගැළපේ. එය තෝරා ඊට අදළ **අංකය** ඉදිරියේ ඇති **වරහන් තුළ ලියන්න**.

**21.** **ශ්‍රී ලංකාවට බුද්ධාගම හඳුන්වාදීම**

(1) තුන්වන ධර්ම සංගායනාව
(2) මිහිඳු මාහිමියන්ගේ ලංකාගමනය
(3) සංඝමිත්තා තෙරණියගේ වැඩමවීම
(4) මහමෙවුනා උයන සඟසතු කිරීම
(5) මහානාග යුවරජු පැවිදිවීම (………)

**22.** **පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ ආගමික කටයුතු**

(1) වටදගේ කරවීම
(2) තුන් නිකාය එක්සත් කරවීම
(3) ගල්විහාර කතිකාවත පිහිටුවීම
(4) අඹගමුව ග්‍රාමය ශ්‍රී පාදස්ථානයට පවරාදීම
(5) ආළාහන පිරිවෙන කරවීම (………)

**23.** **දෙවන රාජසිංහ රජතුමා**
(1) 1630 රන්දෙනිවෙල සටනේ දී උඩරට හමුද ජයග්‍රාහී ලෙස මෙහෙයවීම
(2) 1638 දී ලන්දේසීන් සමඟ ගිවිසුමක් අත්සන් කිරීම
(3) උපසම්පදාව පැවැත්වීම සඳහා සියමෙන් භික්ෂූන් වහන්සේලා වැඩම කරවීම
(4) ලන්දේසීන්ගේ ආධාර ඇතිව පෘතුගීසීන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වලින් පලවාහැරීම
(5) දෙවන රාජසිංහ රජතුමාගේ රාජ්‍ය සමයේ රොබට් නොක්ස් සිරකරුවකු ලෙස උඩරට රාජ්‍යයේ ජීවත්වීම (.........)

**24.** **1817-18 බ්‍රිතාන්‍ය විරෝධී උඩරට නැගී සිටීම**
(1) වෙල්ලස්ස ප්‍රදේශයෙන් ආරම්භ වීම
(2) උඩරට ප්‍රධානීන් නායකත්වය ගැනීම
(3) විල්බාවේ, තමන් දෙරේසාමි ලෙස ප්‍රකාශ කිරීම
(4) මෙම සටන මැඩලීමෙන් පසු ජෝන් ඩොයිලි උඩරට ප්‍රදේශවල රෙසිඩන්ට්වරයා ලෙස පත්කිරීම
(5) මෙම සටන මැඩලීමෙන් පසු බ්‍රිතාන්‍ය ආධිපත්‍යය උඩරට ප්‍රදේශවල ස්ථාවර ලෙස පිහිටුවනු ලැබීම (.........)

**25.** 1972 **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**
(1) ජනාධිපතිධුරය හඳුන්වාදීම
(2) ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වීම
(3) ඒක මණ්ඩල ව්‍යවස්ථාදායක සභාවක් පිහිටුවීම
(4) රාජ්‍ය සේවා කොමිසම අවලංගු කිරීම
(5) සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වාදීම (.........)

● අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A), (B), (C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය.** නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,
(A) සහ (B) පමණක් නිවැරදි නම් ........................................ 1 ද,
(B) සහ (C) පමණක් නිවැරදි නම් ........................................ 2 ද,
(C) සහ (D) පමණක් නිවැරදි නම් ........................................ 3 ද,
(A) සහ (C) පමණක් නිවැරදි නම් ........................................ 4 ද,
ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් .......... 5 ද, **වරහන් තුළ ලියන්න.**

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය. |

**26.** **වළගම්බා රජතුමාගේ පාලන සමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) හේමමාලා කුමරිය දන්ත ධාතූන් වහන්සේ ලක්දිවට වැඩම කරවූවා ය.
(B) දමිළ ප්‍රධානීන් හත්දෙනෙක් ලංකාව ආක්‍රමණය කළහ.
(C) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරනු ලැබී ය.
(D) මෝරිය-ලම්බකර්ණ ගැටුම් ආරම්භ විය. (.........)

**27.** **පළමුවන විජයබාහු රජතුමාගේ කාර්ය සංසිද්ධීන් සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) රට එක්සේසත් කිරීම
(B) උපසම්පදා විනය කර්මය සිදු කොට භික්ෂු ශාසනය යළි පිහිටුවීම
(C) කාලිංග මාඝ පරාජය කිරීම
(D) තිබ්බතය සමඟ ආගමික සම්බන්ධතා පැවැත්වීම (.........)

**28.** **සීතාවක රාජ්‍යයේ බිඳවැටීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) පළමුවන රාජසිංහ රජුගේ කාර්ය සාඵල්‍යය ශක්තිමත් ලෙස ඉදිරියට ගෙන යා හැකි අනුප්‍රාප්තිකයකු නොමැති වීම
(B) පළමුවන රාජසිංහ රජු ශිව ආගම වැළඳ ගැනීම
(C) සීතාවක රාජධානියට අයත් ප්‍රදේශ පෘතුගීසීන් විසින් අල්ලාගනු ලැබීම
(D) පළමුවන විමලධර්මසූරිය රජුගේ නැගීම (.........)

**29.** **දහනවවන සියවසේ දේශීය කෘෂිකර්මය යළි නගාසිටුවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) 1840 අංක 12 දරන 'මුඩුබිම් ආඥපනත' දේශීය කෘෂිකර්මය නගාසිටුවීමට ඉවහල් විය.
(B) හෙන්රි වෝඩ් ආණ්ඩුකාරවරයා පුරාණ වාරිමාර්ග නගා සිටුවීම සඳහා වැදගත් සේවයක් ඉටු කළේ ය.
(C) ග්‍රාමීය වැව් පිළිසකර කිරීම හා නඩත්තු කිරීම සඳහා ගම්සභා ක්‍රමය උපයෝගී කර ගන්නා ලදී.
(D) මින්නේරි ගොවි ජනපද ව්‍යාපාරය ආරම්භ කරන ලදී. (.........)

**30.** **ලංකා ජාතික සංගමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?**

(A) ලංකා ජාතික සංගමය 1919 දී පිහිටුවන ලදී.
(B) පොන්නම්බලම් රාමනාදන් මහතා මෙම සංගමයේ ප්‍රථම සභාපතිවරයා විය.
(C) එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා කලක් මෙම සංගමයේ ලේකම්වරයකු විය.
(D) මෙම සංගමයේ ප්‍රධානම අරමුණ වූයේ සර්වජන ඡන්ද බලය දිනා ගැනීම ය. (.........)

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති **වරහන තුළ ලියන්න**.

**31.** **විජිතපුරය බිඳ වැටීමෙන් පසු එළාර රජුට ආධාර පිණිස පැමිණි දකුණු ඉන්දීය ප්‍රධානියා කවරෙක් ද?**

(1) භල්ලුක
(2) දීඝජන්තු
(3) පුලහත්ථ
(4) පනයමාර
(5) දාඨික (.........)

**32.** **තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන් විසින් රචිත සන්දේශ කාව්‍යය කුමක් ද?**

(1) තිසර සන්දේශය
(2) මයුර සන්දේශය
(3) කෝකිල සන්දේශය
(4) සැලළිහිණි සන්දේශය
(5) ගිරා සන්දේශය (.........)

**33.** **ශ්‍රී ලංකාවේ සිංහල රජ පෙළපතේ අවසාන රජතුමා කවරෙක් ද?**

(1) දෙවන රාජසිංහ රජතුමා
(2) දෙවන විමලධර්මසූරිය රජතුමා
(3) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා
(4) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා
(5) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා (.........)

**34.** **කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවන ලද්දේ කුමන බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයාගේ පාලන සමයේ දී ද?**

(1) තෝමස් මේට්ලන්ඩ්
(2) විල්මට් හෝර්ටන්
(3) වෙස්ට් රිජ්වේ
(4) හෙන්රි මැකලම්
(5) රොබට් චාමර්ස් (.........)

**35.** **ශ්‍රී ලංකාවේ අග්‍රාණ්ඩුකාර ධුරයට පත් වූ ප්‍රථම ලාංකිකයාගේ නම කුමක් ද?**

(1) ඩී.එස්. සේනානායක මහතා
(2) ජෝන් කොතලාවල මහතා
(3) ඔලිවර් ගුණතිලක මහතා
(4) එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා
(5) විලියම් ගොපල්ලව මහතා (.........)

[ හයවෙනි පිටුව බලන්න.

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලයද'යි තෝරා ඊට අදාළ **අංකය වරහන් තුළ ලියන්න.**

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදි ය. | වැරදි ය. |
| 2. | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3. | වැරදි ය. | වැරදි ය. |
| 4. | වැරදි ය. | නිවැරදි ය. |
| 5. | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | ත්‍රිකුණාමලය වූ කලී ඉන්දියන් සාගරයේ ඇති විශාලතම හා ආරක්ෂිත ස්වාභාවික වරායකි. | ශ්‍රී ලංකා ඉතිහාසයේ පැරණි අවධියේ දී ත්‍රිකුණාමලය මහාතිත්ථ නමින් හඳුන්වනු ලැබී ය. | (.........) |
| 37. | පනාකඩුව තඹ සන්නස පළමුවන පරාක්‍රමබාහු රජතුමා සහ දෙවන ගජබාහු රජතුමා අතර ඇති වූ ගිවිසුම වාර්තා කර ඇත. | පොළොන්නරු යුගයේ සෙල්ලිපි විශාල ම සංඛ්‍යාව කර වූ පලකයා පළමුවන පරාක්‍රමබාහු රජතුමා ය. | (.........) |
| 38. | ලන්දේසීන් විසින් ශ්‍රී ලංකාවට රෝමානු කතෝලික ආගම හඳුන්වාදෙන ලදී. | ලන්දේසීහු ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශවල ඇළ මාර්ග පද්ධතියක් දියුණු කළහ. | (.........) |
| 39. | කොළඹ-මහනුවර දුම්රිය මාර්ගය ඉදි කිරීම කෝපි වගාවේ ව්‍යාප්තියට ආධාර විය. | කොළඹ-මහනුවර දුම්රිය මාර්ගය, උඩරට සිට කොළඹට කෝපි ප්‍රවාහනය කිරීමට පමණක් නොව, කෝපි වගාවට අත්‍යවශ්‍ය වූ උපකරණ හා පොහොර කොළඹ සිට උඩරටට ප්‍රවාහනය කිරීම ද පහසු කරවී ය. | (.........) |
| 40. | 1972 දී පළමුවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හඳුන්වාදෙන ලදී. | ජේ.ආර්. ජයවර්ධන මහතා ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිවරයා විය. | (.........) |

* *

[ හත්වෙනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
**General Certificate of Education (Adv. Level) Examination, August 2012**

**නව නිර්දේශය**
**புதிய பாடத்திட்டம்**
**New Syllabus**

| | | |
|---|---|---|
| ඉතිහාසය | I | (II කොටස) |
| வரலாறு | I | (பகுதி II) |
| **History** | I | (Part II) |

25 S I

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා**

**උපදෙස්:**

※ **පළමුවන** ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.

(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ශ්‍රී ලංකාවේ දළ සිතියමක්** සපයා ඇත.)

## II කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.** ඒවායින් කැමති **දෙකක්** පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

| | | | |
|---|---|---|---|
| (i) මහාතිත්ථ | (ii) අනුරාධපුරය | (iii) නාච්චදූව වැව | (iv) වළවේ ගඟ |
| (v) ත්‍රිකුණාමලය | (vi) ගාල්ල | (vii) බලන | (viii) ඌව පළාත |

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු **05** බැගිනි)*

2. "දුටුගැමුණු රජතුමාගේ කාර්යසාඵල්‍යය උත්කෘෂ්ට ලෙස මහාවංසයෙහි දක්වා ඇත."
   (i) දුටුගැමුණු රජතුමාගේ කාර්යසාඵල්‍යය විස්තර කොට ඇති මහාවංසයේ කතුවරයා නම් කරන්න. *(ලකුණු 01 යි)*
   (ii) දුටුගැමුණු රජතුමාට පෙර මාගම පාලනය කළ රජවරුන් **දෙදෙනකු** නම් කරන්න. *(ලකුණු 02 යි)*
   (iii) දුටුගැමුණු රජතුමාගේ දේශපාලන කාර්යසංසිද්ධිය සැකෙවින් දක්වන්න. *(ලකුණු 04 යි)*
   (iv) මහාවංස කතුවරයා විසින් දුටුගැමුණු රජතුමාගේ කාර්යසංසිද්ධිය උත්කෘෂ්ට තත්ත්වයට පත්කොට ඇති ආකාරය පරීක්ෂා කරන්න. *(ලකුණු 07 යි)*

3. මහසෙන් රජතුමාගේ රාජ්‍ය සමයේ සිට දෙවන අග්බෝ රජතුමාගේ රාජ්‍ය සමයේ අවසානය තෙක් ලක්දිව වාරිමාර්ග ක්‍රමයේ වර්ධනය සැකෙවින් සමාලෝචනය කරන්න. *(ලකුණු 14 යි)*

4. පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ ක්‍රියා කලාපය පොළොන්නරු රාජධානියේ පරිහානියට හේතු වී යැයි පවත්නා මතයට ඔබ එකඟ වන්නෙහි ද? හේතු දක්වන්න. *(ලකුණු 14 යි)*

5. "දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ රාජ්‍ය සමය, ශ්‍රී ලංකා ඉතිහාසයේ අතිශය වැදගත්කමකින් යුක්ත වේ."
   (i) දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ පූර්වගාමියා නම් කරන්න. *(ලකුණු 01 යි)*
   (ii) දෙවන පරාක්‍රමබාහු රජතුමා මුහුණ දුන් අභියෝග **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*
   (iii) දෙවන පරාක්‍රමබාහු රජතුමා විසින් බුද්ධාගම කෙරෙහි දක්වන ලද අනුග්‍රහය සැකෙවින් දක්වන්න. *(ලකුණු 04 යි)*
   (iv) දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ රාජ්‍ය සමය අතිශයින් වැදගත් එකක් ලෙස සැලකෙන්නේ මන්ද'යි සාකච්ඡා කරන්න. *(ලකුණු 07 යි)*

6. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල පෘතුගීසි හා ලන්දේසි පාලනය හේතුකොටගෙන සංස්කෘතික වශයෙන් ඇති වූ ප්‍රතිඵල කවරේ ද? *(ලකුණු 14 යි)*

7. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
   (i) හයවන පරාක්‍රමබාහු රජතුමාගේ දේශපාලන කාර්යසංසිද්ධිය
   (ii) පෘතුගීසීන් හා යාපනය රාජ්‍යය අතර සම්බන්ධතා
   (iii) වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමි
   (iv) 1815 උඩරට ගිවිසුම
   (v) දහනවවන සියවසේ දෙවන භාගයේ ආගමික පුනර්ජීවනය *(එක් කොටසකට ලකුණු 07 බැගිනි)*

8. කෝල්බෲක්-කැමරන් කොමිසම විසින් ඉදිරිපත් කරනලද ආණ්ඩුක්‍රම, පරිපාලන සහ අධිකරණ ප්‍රතිසංස්කරණ යෝජනා පරීක්ෂා කරන්න. *(ලකුණු 14 යි)*

9. **එක්කෝ (A)** කොටසට **නැතහොත් (B)** කොටසට පමණක් පිළිතුරු සපයන්න.
   (A) සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. *(ලකුණු 14 යි)*
   (B) 1956 මහා මැතිවරණයේ වැදගත්කම පරීක්ෂා කරන්න. *(ලකුණු 14 යි)*

***

19849

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

AL/2012/25-S-I

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ඉතිහාසය I
வரலாறு I
History I

25 S

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 01

විභාග අංකය / சுட்டெண் / Index No. ......................................




WWW.PastPapers.WIKI
Past Papers Wiki - Download More Past Papers and Study Well!